**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**පුරප්පාඩු දැන්වීමයි**

***බහු තාක්ෂණ ශිල්පී (ප්‍රධාන කාර්යයාලය - පුරප්පාඩු 1, ජාතික නිවාඩු නිකේතන - පුරප්පාඩු 02)***

***තනතුරට අදාල කාර්යයන්***

- *විදුලි බලය, ජල පොම්පාගාරය, වායු සමීකරණ, ජෙනරේටර්, විදුලි සෝපාන ආදියෙහි නඩත්තු කටයුතු සඳහා සහය දීම.*
- *දුරකථන මාර්ගයන් විධිමත් පරිදි නඩත්තුකිරීමට සහය වීම.*
- *ආයතන ගොඩනැගිලි පරිශ්‍රයේ නඩත්තු කටයුතු සොයා බලා වාර්තා කිරීම හා නඩත්තු කටයුතු සඳහා සහය වීම.*
- *විවිධ උත්සව අවස්ථාවලදී ආලෝකකරණය හා අනෙකුත් සහයක කටයුතු සිදුකිරීම.*
- *පරිශ්‍ර කළමනාකරණ කටයුතුවලට අදාල ලිපි හා ගොනු සැකසීම, අවශ්‍ය මිලදී ගැනීම් සඳහා සහයවීම හා නඩත්තු කටයුතු සිදුකිරීම.*
- *අංශභාර ප්‍රධානී හා/ හෝ ආයතන ප්‍රධානී විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරීන් ඉටු කිරීම.*

***සුදුසුකම්***

***බාහිර අයදුම්කරුවන්***

***ශිල්පීය නිපුණතා***

*එක් එක් තනතුරෙහි කාර්යයභාරයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (4) වැනි මට්ටමට නොඅඩු මට්ටමක මෝටර් කාර්මික/ විදුලි කාර්මික/ ජල කාර්මික/ වායුසමන/ පෙදරේරු/ වඩු කාර්මික සම්බන්ධ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.*

***අභ්‍යන්තර අයදුම්කරුවන්***

*අදාල ක්ෂේත්‍රයේ වසර පහ (5) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූලවන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (4) වැනි මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්ව තිබීම.*
*හෝ*
*එක් එක් තනතුරෙහි කාර්යයභාරයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (4) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.*

***වයස***
*අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි අය විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.*

**වැටුප් පරිමාණය**

PL 3 රු. 26,290/- 10 x රු.270/- 10 x රු.300/- 10 x රු.330/- 12 x රු.350/- රු.39,490/-

**මූලික වැටුප් තලය**

රු. 26,290/- + ජීවන වියදම් දීමනාව + විශේෂ දීමනාව

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල ආවරණය වන ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණ ක්‍රමයක්
- ණය පහසුකම්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණු අවස්ථා
- ප්‍රවාහන දීමනාව

**සටහන**

**තෝරා පත් කරගන්නා අයදුම්කරුවන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුරාධපුර, කතරගම, බණ්ඩාරවෙල හා නුවරඑළිය ස්ථානවල පිහිටි ඕනෑම ජාතික නිවාඩු නිකේතනයක සේවය භාර ගැනීමට සූදානම් විය යුතුය.**

උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරන අපේක්ෂකයින් අපගේ වෙබ් අඩවියෙන් https://www.sltda.gov.lk/en/careers අයදුම්පත බාගත කල හැකිය.

ඔබ රැකියාවට සුදුසු යැයි සිතන්නේ නම් ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ඇතුලත් ඔබගේ ජීව දත්ත (CV), අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්වල සහතික පත්වල පිටපත්, සේවා පළපුරුද්ද ඇතුලත් සේවා සහතිකවල පිටපත් සමඟ සම්පූර්ණකරන ලද අයදුම් පත්‍රය ලියාපදිංචි තැපැල හරහා සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, නො. 80, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයට 13.12.2024 දිනට හෝ ඊට පෙර එවන්න.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර ඔබ අයදුම්කරන තනතුර සඳහන් කරන්න.

රජයේ දෙපාර්තමේන්තු/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ඉදිරිපත් කල යුතුය.

**සභාපති**
**ශ්‍රී ලංකා සංචාරක සවංර්ධන අධිකාරිය**
**නො. 80, ගාලු පාර**
**කොළඹ 03**